# වයාපෘති අධීක්ෂණ වාර්තාව (2017/08/02දිනට)

(එක් ව්‍යාපෘතියක් සඳහා එක් වාර්තාවක් බැගින්)

1. අධීක්ෂණය කළ නිලධාරියාගේ නම : ආර්.ඩී සමතපාල

2. තනතුර : සංවර්ධන නිලධාරි

3. අධීක්ෂණය කළ ව්‍යාපෘතිය -

- අයත් පළාත : වයඹ
- දිස්ත්‍රික්කය හා නගරය : කුරුණෑගල
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : පන්නල
- ගොවිජන සේවා මධ්‍යස්ථානය : වෙල්පල්ල

4. අධීක්ෂණය කළ ව්‍යාපෘතිය : කාබනික පොහොර නිෂ්පාදනය ,භාවිතය සහ දිරිගැන්වීමේ වැඩසටහන

5. අධීක්ෂණය කළ ව්‍යාපෘතිය අයත් ආයතනය : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රය - මාකඳුර,ගෝනවිල

6. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම : 2017 වර්ෂයට අදාලව මාකඳුරට රු.මි 15.5 ක් ලබා දී ඇතර එයින් කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රය සඳහා රු.මි 3.88 ලබා දී ඇති අතර 2017.ජුනි 30 ට සම්පූර්ණ වියදම රු.මි 0.455 කි. වියදම් විස්තරය පහත දක්වා ඇත.

7. ව්‍යාපෘතිය සඳහා වැයකර ඇති මුදල : කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රය සඳහා ලබා දී ඇති රු.මි 3.88 න් 2017 ජුනි 30 දක්වා වියදම් විස්තරය

| රු.මි 3.88 ක ප්‍රතිපාදනය වෙන්කර ඇති අයුරු | වෙන්කල මුදල (රු.මි) | 2017.06.30 දිනට ප්‍රගතිය(රු.මි) |
|---|---|---|
| 1.භූමිය සංවර්ධනය සහ ජල සම්පාදනය | 3.88 | 0.455 |
| 2. භෝජනාගාරයේ ඉදිකිරීම් අවසන් කිරීම | | |
| 3. අක්කර 5 ක පලතුරු උද්‍යානය ඉදිකිරීම් | | |
| 4. අක්කර 1 ක කාබනික එළවළු උද්‍යානය ඉදිකිරීම් | | |
| 5. අක්කර 5 ක කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ඒකකය. | | |
| 6.ශ්‍රවණාගාරයේ නඩත්තුව සහ යටිතල පහසුකම් | | |
| 7.යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම( කොකු නගුල ,ඩිස්ක් නගුල) | | |

8.

| අධීක්ෂණය කල ක්‍රියාකාරකම් (ක්‍රියාකාරි සැලැස්මට අනුව) | ක්‍රියාකාරකම ආරම්භකල දිනය | වර්තමාන තත්ත්වය (ප්‍රගතිය) | නිරීක්ෂණය කළ සුවිශේෂී කරුණු | එක් එක් ක්‍රියාකාරකම සඳහා වගකිව යුතු නිලධාරියා |
|---|---|---|---|---|
| 1.කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම,ඉඩම සංවර්ධනය කිරීම සහ ආපනශාලාව ඉදිකිරීම | 2016 ජනවාරි මස ආරම්භ කර ඇති අතර 2017 වර්ෂයේ ද මධ්‍යස්ථානය අවට සංවර්ධන කටයුතු සිදුකෙරේ . | ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර නඩත්තු කටයුතු හොඳින් සිදු කෙරෙන බව පෙනුනි.ඊට යාබදව ආපනශාලාවේ ඉදිකිරීම් කටයුතු ද අවසන් කර ඇති අතර භාවිතයට ගෙන ඇත. මේස ,පුටු , සහ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ (Multi media),යනා දී කාර්යාලීය උපකරණ සහ ශ්‍රවණාගාරයට අවශ්‍ය උපකරණ මිලදීගෙන ගෙන ඒවා භාවිතයට ගෙන ඇත. | - ශ්‍රවණාගාරයේ ආසන 350 ක් පමණ ඇති අතර Multi media සහිත තාක්ෂණ ක්‍රම භාවිතයෙන් දේශණ පැවැත්විය හැක.<br><br>- ශ්‍රවණාගාරයේ දේශණ පවත්වන සම්පූර්ණ කොටස කුඩා කණ්ඩායම් කීපයකට දේශණ පවත්විය හැකි පරිදි අනු කොටස් වලට බෙදා නැත | 1.ඒ.එස්.වයි.පී රණසිංහ මයා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)<br>031-2298994<br>071-8503288<br><br>2. ඩී.එම්.පී.එස් දසනායක මිය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)<br>031-2298994<br>071-8232392<br><br>ආර්.පී නිමල් ගුණරත්න මහතා සහකාර අධ්‍යක්ෂ<br>0718202773<br><br>ප්‍රදීප් මහතා<br>කෘෂිකර්ම උපදේශක<br>0718503288 |
| 2.පුහුණු වැඩසටහන් | | 2017.01.01 සිට 2017.07.31 දක්වා පවත්වා ඇති පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 36 කි.සමස්ථ පුහුණු ලාභීන් ගණන 2577 කි.<br>2017.07.31 සිට 2017.12.31 ඉලක්ක ගත පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 22 ක් වන අතර පුහුණු ලාභීන් සංඛ්‍යාව 2500 ක් වේ. | | |
| 3.ප්‍රමිතියකින්යුතු කාබනික පොහොර නිෂ්පාදනය | | ප්‍රමිතියකින් යුතු කාබනික පොහොර නිෂ්පාදනය සඳහා තිබිය යුතු ප්‍රමිතීන් සහිත අවසන් කෙටුම්පත ප්‍රකාශයට පත් කර ඇති අතර එය මහජනතාවගේ අදහස් ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. | | |

9. නිරීක්ෂණය කල සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් :

- ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා දුරබැහැරින් පැමිණෙන පුහුණුවන්නන් සඳහා ප්‍රවාහන ගාස්තු ගෙවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් මාසිකව පවත්වන පුහුණු පංති ප්‍රමාණය සතුටු දායක නොවන මට්ටමක ඇති අතර මෙයට විසඳුමක් ලෙස ආයතනය විසින් ජංගම පුහුණු වැඩසටහන් පවත්වයි. නමුත් දුරබැහැර ස්ථාන වලට ආයතනයේ නිලධාරීන් ගොස් පුහුණුවීම් සිදුකළද මෙම මධ්‍යස්ථානය ආශ්‍රිතව ඇති ආදර්ශන පෙන්වා වැඩසටහන කෙරෙහි උද්යෝගය ඇති කිරීමේ ප්‍රායෝගික අවස්ථා ගිලිහෙන බැවින් මධ්‍යස්ථානයේ ම පුහුණුවට අවස්ථාව සැපයීම කෙරෙහි අවධානය දැක්වීම උචිත බව යෝජනා කරමි.

- ශ්‍රවණාගාරයේ දේශණ පවත්වන සම්පූර්ණ කොටස කුඩා කණ්ඩායම් කීපයකට එකවර දේශණ පැවැත්විය හැකි පරිදි තාවකාලික අනු කොටස් වලට බෙදා වෙන් කිරීම වඩාත් සුදුසු වේ.

10 .අදාළ කරුණු සම්බන්ධයෙන් වන ඔබගේ නිර්දේශ :

- ශ්‍රවණාගාරයේ ඇති සම්පත් උපරිම ලෙස ප්‍රයොජනයට ගත හැකිවන පරිදි දේශණ (පුහුණු පංති) වැඩි ප්‍රමාණයක් සංවිධානය කර ගත යුතුය. නො එසේ නම් ගෙවීමේ පදනම මත වෙනත් ආයතන සඳහා ශ්‍රවණාගාරය ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කල යුතුය.

- වයඹ පළාතේ කෘෂිකාර්මික පුහුණු අවශ්‍යතා ඉටුකිරීම උදෙසා කුරුණෑගල දිස්ත්‍රික් සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම

- ශ්‍රවණාගාරයේ ආසන 350 ක් පමණ ඇති අතර විශාල කණ්ඩායම් සඳහා දේශණ පවත්වන අවස්ථාවල හැර කුඩා කණ්ඩායම් සඳහා දේශණ පැවැත්විය හැකි වන පරිදි ශ්‍රවණාගාරය තාවකාලික අනු කොටස් වලට බෙදා වෙන් කිරීමේ පහසුකම්(partitioning) සහිතවඉදිකිරීම තුලින් අනවශ්‍ය විදුලි පහන් සහ විදුලි පංකා ක්‍රියා විරහිත කර විදුලිය වැනි සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කළ හැක.

- දෛනික පුහුණු කටයුතු සඳහා දුර බැහැර ප්‍රදේශ වලින් පැමිණෙන කණ්ඩායම් හෝ පුද්ගලයින් වෙනුවෙන් නේවාසිකාගාර පහසුකම් සැපයීමේ අවශ්‍යතාවය පෙනුනි

- මෙම වැඩසටහන් සම්බන්ධ නිරන්තර අධීක්ෂණය සහ මගපෙන්වීම සහ වරින්වර සිදුකරන විගණනය වැදගත්වේ.

11.මා.නි උපදෙස් හා නිර්දේශ :

මාකඳුර කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රයේ 2010 වර්ෂයේ අගභාගයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර, කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාබනික පොහොර අංශය විසින් ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත. සියළු වියදම් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ද ලියකියවිලි සම්බන්ධ කටයුතු ද එම අංශය විසින් සිදුකරන ලද බව දැනට මාකඳුර කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රයේ සහකාර අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන ආර්.පී නිමල් ගුණරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වසර තුනක් තුළ ඉදිකිරීම් අවසන් කර කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර දී ඇති අතර, එහි පරිපාලන කටයුතු ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදුකර ඇත. එමෙන්ම දැනට කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රයේ කළමණාකරණය සතුව ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ කිසිදු තොරතුරක් නොමැති බව ප්‍රකාශ විය. මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ආසන්න වශයෙන් රු.මි. 66 ක් වියදම් කර ඇති අතර ආපන ශාලාව සඳහා රු.මි.3.8 ක් පමණ වැය වී ඇත.

නවීන උපාංග සහිතව, නිලධාරීන් 350 කට පමණ එකවර දේශන පැවැත්වීමේ හැකියාව සහිත ශ්‍රවනාගාරය 2016 වර්ෂයේ අතිගරු ජනාධිපතිතුමා විසින් නිල වශයෙන් විවෘත කරනු ලැබුවත් ඊට පෙර සිටම එහි පුහුණුවීම් කටයුතු සිදුකරන ලද බව එහි කටයුතු කරන ආර්.පී නිමල් ගුණරත්න මහතා පවසන ලදී.

ඒ අනුව මෙම ආයතනය විසින් සිදුකරන ලද පුහුණුවීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**2010 සිට 2016 දක්වා පුහුණු ලාභීන්ගේ සංඛ්‍යාව**

| පුහුණුව සිදුකළ වසර | සිදුකළ පුහුණු සංඛ්‍යාව | ගොවීන් | නිලධාරීන් | පාසල් ළමුන් හා විශ්ව විද්‍යාල සිසුන් | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 2010 | 171 | 5798 | 2366 | 719 | 8883 |
| 2011 | 186 | 8701 | 1548 | 466 | 10715 |
| 2012 | 61 | 2199 | 848 | 406 | 3453 |
| 2013 | 89 | 2948 | 1823 | 332 | 5103 |
| 2014 | 128 | 6082 | 1768 | 253 | 8103 |
| 2015 | 73 | 3958 | 2011 | 213 | 6182 |
| 2016 | 59 | 3708 | 1699 | 72 | 5479 |

2017 වර්ෂයේ ජුනි මස 30 දින දක්වා ආයතනික පුහුණුවීම් 36 ක් පුද්ගලයින් 2577 ක් සඳහා පවත්වා ඇත. මෙම වසර අවසාන විනවිට තවත් පුද්ගලයින් 2500 කට පුහුණු වැඩමුළු පැවැත්වීමට නියමිත වේ. පුහුණු කටයුතු සඳහා සහභාගීවන පුද්ගලයින් සඳහා කොම්පොස්ට් මල්ලක්, අත්පත්‍රිකා , පොත් පිංච හා ආහාර පාන නොමිලේ ලබාදෙන අතර එම වියදම් විශිෂ්ඨතා කේන්ද්‍රය වෙත පුහුණු කටයුතු සඳහා වාර්ෂිකව ලබාදෙන මුදලින් සිදුකරයි.

- කෙසේ වෙතත් මෙම ශ්‍රවනාගාරය භාවිතා කිරීම සතුටුදායක තත්ත්වයේ නොමැත. නවීන පහසුකම් සහිතව පුද්ගලයින් 350 කට අසුන්ගත හැකි ශ්‍රවනාගාරයක් පැවතිය ද ඉහත වගුව පරීක්ෂා කිරීමේ දී 2016 හා 2017 වර්ෂවල පුහුණු වැඩමුළු පැවැත්වීමේ අඩුවක් දක්නට ඇත. මෙම ශ්‍රවනාගාරය රු.මි.66 ක් වියදම් දරා ඉදිකර ඇතත් එය ප්‍රශස්තව භාවිතා කිරීමක් නොවන බව පෙනී යයි.

## නිර්දේශ

- විවිධත්වයෙන් යුත් පුහුණු වැඩමුළු සංවිධානය කර වැඩි නිලධාරීන් හා ගොවි මහතුන් පිරිසක් ඒ සඳහා ආකර්ෂණය කරගැනීමට කටයුතු කිරීම.
- අදාළ ආයතනය විසින් ශ්‍රවනාගාරය භාවිතා නොකරන අවස්ථාවල දී ක්‍රමවත් වැඩපිළිවෙලක් යටතේ වෙනත් ආයතනවල දේශන හෝ උත්සව සඳහා කුලියට දී මුදලක් අයකිරීමට කටයුතු කිරීම.
- දිවයින පුරා පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කාර්යාලවල නිලධාරීන් සමඟ සාකච්ඡාකර ක්‍රමවත් පුහුණු කාලසටහනක් යටතේ වැඩිපිරිසකට දැනුවත්භාවය හා සේවය සැලසෙන පරිදි වැඩමුළු සංවිධානය කිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ ප්‍රමිති සහතිකරණය කඩිනමින් ලබාගැනීමට කටයුතු කිරීම හා ඒ පිළිබඳ කාබනික පොහොර නිෂ්පාදකයින් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.
- 350 දෙනෙකුට ප්‍රමාණවත් දේශන ශාලාව ඊට වඩා අඩු පිරිසකට භාවිතා කිරීමේ දී සිදුවන සම්පත් නාස්තිය අවම කිරීමට පියවර ගත යුතුය.

....................................

ආර්.ඩී සමතපාල (සං.නි)
ක්ෂේත්‍ර අධීක්ෂණය

....................................

දිලූපා එන්. අඹේපිටිය
සහකාර අධ්‍යක්ෂ(මෙහෙයුම් හා ඇගයුම්)
කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

(2017.08.02 දිනට)

# කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රය - මාකඳුර, ගෝනවිල





ගොඩනැගිල්ලේ ඉදිරිපස


ගොඩනැගිල්ලේ පසුපස


ගොඩනැගිල්ල ඉදිරිපස භූමි දර්ශණය

# කාබනික ගොවිතැන සඳහා වූ විශිෂ්ටතා කේන්ද්‍රයේ ඉදිකර ඇති ශ්‍රවණාගාරය



දේශණ සඳහා පාසැල් සිසුන් ලියාපදිංචි වෙමින්



පාසැල් සිසුන් සඳහා දේශණයකට සූදානම් වෙමින්





## කාබනික ගොවිතැන සදහා වු විශිෂ්ටතා කේන්ද්‍රයේ ඉදිකර ඇති භෝජනාගාරය.



භෝජනාගාරයේ ඉදිරිපස





භෝජනාගාරයේ අභ්‍යන්තර දසුන්

# සංවර්ධනය කරමින් පවතින පලතුරු උද්‍යානයේ කොටසක්









